සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / **Paper**: I | කාලය / காலம் / **Time**: පැය 03 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) අධ්‍යාත්මික හා සමාජමය වශයෙන් විවිධ දුක් කම් කටොළු වලට මුහුණ දුන් ජුදා සමාජයේ ජනයාට මහත් අස්වැසිල්ලක් වූයේ,
- (i) සීසර් විසින් ගැනීමට නියම කළ සංගණනයයි
- (ii) කිතු උපත පිළිබඳ දිවැස් වැකිය
- (iii) ජෙරුසලමේ දේව මාළිගය නැවත ගොඩ නැගීම යි.
- (iv) ස්නාවක ජොහාන්ගේ උපතයි

(02) ''ලෝකයේ පාපය දුරුකරන දෙවියන්ගේ බැටලු පෝතකයාණෝ'' යන හැඳින්වීම කරනු ලැබූයේ,
- (i) දිවැසිවර ජෙරමියා විසින් ජේසුස් වහන්සේ පිළිබඳවය
- (ii) ජේසුස් වහන්සේ විසින් ස්නාවක ජොහාන් පිළිබඳවය
- (iii) ජොහාන් තුමා විසින් පේදුරු පිළිබඳවය
- (iv) ස්නාවක ජොහාන් තුමා විසින් ජේසුස් වහන්සේ පිළිබඳවය

(03) ඇදහිල්ල හා කීකරුකම හේතුවෙන් ආබ්‍රහම් ලද ආශිර්වාදය වූයේ,
- (i) සාරධර්මයෙන් හෙබි සමාජයක් හා යහපත් දිවි පැවැත්මකි
- (ii) සම්පත් සම්භාරයක් හා සමාජ දර්ශනයකි
- (iii) සශ්‍රීක දේශයක් හා ආසිරි පැතීමේ නාමයකි
- (iv) සාමකාමී අසල්වැසි රාජ්‍ය සමූහයක් හා විශාල දරු පරපුරකි

(04) ජේසුස්වහන්සේගේ සේවය යොමුවන ජන කොටස් ලෙස, නාසරෙත් දහම් දෙසුමෙන් අනාවරණය වූ අය නම්,
- (i) වහලුන්, සොරුන්, අන්ධයන් හා දිවැසිවරුන් ය
- (ii) පීඩිත වූවන්, අන්ධයන්, දරුවන් හා සොරුන් ය
- (iii) ආගමික නායකයන්, බිහිරි අය, වහලුන් හා දිළිඳුන් ය
- (iv) දිළිඳුන්, වහලුන්, අන්ධයන් හා පීඩිත වූවන් ය

(05) ''මේ රැලට අයිති නොවූ අන් බැටලුවෝද මට ඇත්තාහ'' යන ජේසුස්වහන්සේගේ ප්‍රකාශයෙන් ගම්‍ය වනුයේ,
- (i) එඬේරාගේ රැළ යනු අප පමණක්ම වන බවයි
- (ii) අන්තරාදායක රැළ වලින් තම බැටළුවන් ආරක්ෂා කිරීම ප්‍රධාන එඬේර කාර්යය බවයි
- (iii) එඬේරාගේ භාරයට දී ඇති අය පිළිබඳව අධිකාරීත්වයෙන් ක්‍රියා කලයුතු බවයි
- (iv) සමාජයේ අන් අය වෙතටද අපගේ සේවය විහිදුවාලීමට ක්‍රියා කළ යුතු බවයි

(06) ආත්මාර්ථය නසා දේව කැමැත්තට අවනත වීම පිළිබඳ වඩාත් වැදගත් නිදසුන නම්,
(i) ජේසුස් වහන්සේ ගෙත් සෙමනේ යැදීමයි
(ii) දිළිඳු වැන්දඹුවගේ පූජාවයි
(iii) ශ්‍රාවකයන්ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ විවාදයයි
(iv) ලාදුරු රෝගීන් දස දෙනාගේ සිදුවීමයි

(07) සාමය පිළිබඳ දිවැසිවර ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ,
A - සාමය, යුක්තිය හා ධර්මිෂ්ඨකම මත පදනම් වේ
B - සාමයේ ප්‍රතිඵලය සමෘද්ධිය වේ
C - සාමය තුළ යුධ මානසිකත්වය සම්පූර්ණයෙන් පහවී යයි
D - සාමයට කෙළවරක් නොමැත
ඒ අතුරෙන් යෙසායා දිවැසිවරයාගේ කියමන් වනුයේ,
(i) A හා B ය (ii) B හා C ය (iii) C හා D ය (iv) D හා A ය

(08) පෙන්තකොස්ත දින පේදුරු තුමාගේ දේශනය තුලින් හෙළිදරව් වූ වැදගත් සත්‍යතාවයකි,
(i) දුර්වල මිනිසුන් කෙරෙහි සංවේදී වීමේ අවශ්‍යතාවය
(ii) පසුතැවීම තුළින් විශ්වාසය තහවුරු කිරීමේ වැදගත්කම
(iii) තරතිරම් බැලීමේ ආදීනව
(iv) ප්‍රාතිහාර්යාත්මකව ගැළවීමේ විස්මයජනක බව

(09) විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවනු ලැබූවන් හඳුන්වනුයේ,
(i) 'ප්‍රේරිත' යන නමිනි (ii) 'කාරිස්' යන නමිනි
(iii) 'අයිරේනියා' යන නමිනි (iv) 'මෙසියස්' යන නමිනි

(10) පාවුල්තුමා ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ කටුකරාවය දෙන කෛතාලමකට සමාන කරන ලද්දේ,
(i) අන් අයට ඊර්ෂ්‍යා කරන්නන්ය
(ii) වඩාත් නුවණ ඇති අයය
(iii) ප්‍රේමය නොමැති අයය
(iv) ආගමික චාරිත්‍ර ඉටු නොකරන්නන්ය

(11) සද්දුසිවරුන් විසින් ජේසුස් වහන්සේට නගන ලද අභියෝගයකි,
(i) අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්නය
(ii) උපවාස ප්‍රශ්නය
(iii) සබත කඩ කිරීම පිළිබඳ ප්‍රශ්නය
(iv) පව් කමා කිරීම පිළිබඳ ප්‍රශ්නය

(12) ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය, ජාතිකත්වය, වර්ගවාදය අභිබවා ක්‍රියාත්මක වන ප්‍රේමයක් බව පැහැදිළි වනුයේ,
(i) නිකදෙමුස් හමුවීමේ සිදුවීමෙනි
(ii) ජයිරස්ගේ නිවසට යෑමේ සිදුවීමෙනි
(iii) පේදුරුට වගකීම් භාරදීමේ සිද්ධියෙනි
(iv) ස්මාරිය ස්ත්‍රිය හමුවීමේ සිද්ධියෙනි

(13) යෙසායා දිවැසිවරයා විසින් අනාවරණය කරන ලද දේව ලක්ෂණයකි,

(i) සුවිශුද්ධත්වය (ii) අමරණීයත්වය
(iii) සමෘද්ධිමත්භාවය (iv) ඒකත්වය

(14) දෙවියන් වහන්සේගේ ආරාධනය ප්‍රතික්ෂේප කරන අයට සදාකාලිකවම දේව රාජ්‍යය අහිමි වන බව පෙන්නුම් කරන උපමාව නම්,

(i) නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමාවයි
(ii) මහා මංගල භෝජනය පිළිබඳ උපමාවයි
(iii) අබ ඇටය පිළිබඳ උපමාවයි
(iv) වංචනික ගබඩාකාරයා පිළිබඳ උපමාවයි

(15) ''පහනක් දල්වා පහන්රුක උඩ තැබීම'' යන රූපකය අප යොමු කරවන්නේ,

(i) සෑම විටම අවට සමාජයේ වැරදි නිවැරදි කිරීමට ය
(ii) දෛනික අවශ්‍යතා කෙසේ හෝ පිරිමසා ගැනීමට ය
(iii) යහපත්, ධර්මිෂ්ඨ, සත්‍යවාදී ජීවිත මගින් පාපය නසා දැමීමට ය
(iv) නිරතුරුවම ආගන්තුක සත්කාරයේ යෙදීමට ය

(16) ''සළුවේ දාවල්ලට අත තබා සුවය ලැබීම'' යන්නෙන් ගම්‍ය වනුයේ,

(i) දැඩි ප්‍රේමයයි (ii) අසීමිත කමාවයි
(iii) නිහතමානී පැවැත්මයි (iv) පූර්ණ විශ්වාසයයි

(17) පාවුල්තුමාගේ එපීස සේවය අනුගමනය කරන අප,

(i) ධන සම්පත් සියල්ල අත්හැරීමට යොමුවිය යුතුය
(ii) සැබෑවූ එකම දෙවිඳුන් නැමදීමට යොමුවිය යුතුය
(iii) අනුන් විනිශ්චය කිරීමෙන් වැළකිය යුතුය
(iv) තරඟකාරිත්වය පිටුදැකිය යුතු ය.

(18) ධනවත් ප්‍රධානියාට සදාකාල ජීවනය උරුම කර ගැනීමට තිබූ බාධාව ලෙස ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,

(i) ලෞකික වස්තුව නිසි ලෙස කළමණාකරනය නොකිරීමයි
(ii) ධනාත්මක ආකල්ප ඇති කර නොගැනීමයි
(iii) අධ්‍යාත්මික දිළිඳුකමට ගොදුරු වීමයි
(iv) සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට උත්සුක නොවීමයි

(19) සිමියොන්ගේ ජීවිතයෙන් කිතුනුවන්ට ආදර්ශයට ගතහැකි වඩාත් වැදගත්ම ලක්ෂණය වනුයේ,

(i) මරණයට පෙර දේව මන්දිරයේ පදිංචියට යාමට අවස්ථාව ලැබීමයි
(ii) තමා මරණයට පත්වන දිනය නිශ්චිතවම දැන සිටීමයි
(iii) කලින් කළට විමුක්තිය පිළිබඳව අනාවරණය කරනු ලැබීමයි
(iv) ධර්මිෂ්ඨකම තුළ ශුද්ධාත්ම වැඩ විසීම අත්දැකීමයි

(20) පහත සඳහන් වනුයේ ජුදා ආගමික කණ්ඩායම් වලට අයත් ලක්ෂණ කිහිපයකි,

A - උත්තම පූජකයන් පත් කරනු ලැබූයේ මොවුන් අතුරිනි
B - ඔවුහු වාචික මෙන්ම ලිඛිත ව්‍යවස්ථාවද පිළිගත්හ
C - ඔවුනගේ බල කේන්ද්‍රස්ථානය ජෙරුසලමේ දේව මාළිගය විය
D - දේව දූතයන් හා පුනර්ජීවනය පිළිබඳව ඔවුහු විශ්වාස කලහ

මේ අතුරින් පරිසිවරුන්ට අයත් ලක්ෂණ නම්,

(i) A හා B ය (ii) B හා C ය (iii) C හා D ය (iv) D හා B ය

(21) ස්නාවක ජොහාන් තුමාගේ මනස්ථාපනයේ බව්තීස්මය විවෘත වූයේ,
   (i) ජුදා ජනතාවට ය
   (ii) සියලුම ජන කොටස් වලට ය
   (iii) ආරක්ෂක අංශයට ය
   (iv) රාජ්‍ය නිළධාරීන්ට හා ආගමික නායකයන්ට ය

(22) සහජීවනයෙන් ක්‍රියා කිරීමේදී කිතුනුවන්ට මග පෙන්වන වඩාත් වැදගත් පාවුළු ඉගැන්වීම වන්නේ,
   (i) ''දේවගරුබිය ඇතිව ශ්‍රද්ධාවන්ත කමින් පරිපූර්ණ වන්න'' යන්නයි
   (ii) ''එකම අරමුණකින් එක්සත්ව සිටීමෙන් මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න'' යන්නයි
   (iii) ''ඔබ නිදහස්කමට කැඳවනු ලැබුවාහුය'' යන්නයි
   (iv) ''ඔබ ගැළවී සිටින්නේ දේව වරප්‍රසාදය මගින් වූ ඇදහීම කරණකොට ගෙනය'' යන්නයි

(23) අප ජේසුස් වහන්සේගේ රැළට එක්විය යුත්තේ,
   (i) සියලු සිතුම් පැතුම් ඉටුකර ගැනීම උදෙසාය
   (ii) දිවැස් වැකි සම්පූර්ණ වන පිණිසය
   (iii) දේව රාජ්‍යය උරුම කර ගැනීම සඳහාය
   (iv) සියලු අන්තරායයෙන් මිදීම පිණිසය

(24) දෙවියන් වහන්සේගේ රාජ්‍යය උරුම කරගනු ලබන්නේ,
   (i) දූන් සිනාසෙන අය හා සාගිනිව සිටින අය ය
   (ii) දිළිඳු අය හා දූන් පෘෂ්ඨීමත්ව සිටින අය ය
   (iii) ධනවත් අය හා කඳුළු සලන අය ය
   (iv) නිහතමානී අය හා දිළිඳු අය ය

(25) පාවුල්තුමාගේ සිත් හැරීමේ අත්දැකීම තුළ අපට ලැබෙන ආදර්ශයකි,
   (i) අපගේ පෞද්ගලික තීරණ ක්ෂණිකව ක්‍රියාත්මක කල යුතු බව
   (ii) ක්‍රිස්තුන් වහන්සේ තෝරාදෙන පහසු මාර්ගයේ ගමන් කළ යුතු බව
   (iii) නිරතුරුවම අපගේ දැනුම පිළිබඳව අභිමානයෙන් ක්‍රියාකල යුතු බව
   (iv) අපගේ ජීවිතයන්හි හිමිකාරීත්වය ස්වාමින්වහන්සේ සතුකළ යුතු බව

(26) ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයක් නම්,
   (i) පෙන්තකොස්ත මංගල්‍යයයි (ii) පාස්කු මංගල්‍යයයි
   (iii) ස්වර්ගාරෝහණ මංගල්‍යයයි (iv) කැප කිරීමේ මංගල්‍යයයි

(27) ස්නාවක ජොහාන් පිළිබඳ දිවැස් වැකියක කොටසක් පහත දැක්වේ.
''සියලු ...................... පුරවනු ලබන්නේය. සියලු .......................... කපා පහත් කරනු ලබන්නේය. සියලු හෙල් සමතලා කරනු ලබන්නේය''

ඉහත හිස්තැන් වලට අදාල වදන් පිළිවෙලින්,
   (i) ''රළු තැන් හා මාවත්යන්නයි (ii) ''මංමාවත් හා හෙල්'' යන්නයි
   (iii) ''මිටියාවත් හා කඳු හෙල්'' යන්නයි (iv) ''කඳු හා රළු තැන්'' යන්නයි

(28) සෙකරියස් තුමාගෙන් හා ජෝසෙප් තුමාගෙන් අප ලබාගත යුතු වැදගත් මඟ පෙන්වීම් වනුයේ,
(i) වඩාත් ඉවසිලිවන්තවීම හා දෙවිඳුන් වෙනුවෙන් දුක් විඳීමයි
(ii) දෙවි වදන් විශ්වාසයෙන් පිළිගැනීම හා දේව හඬට අවනතවීමයි
(iii) නිහතමානීව ක්‍රියා කිරීම හා දේව සැලැස්මට ප්‍රතිචාර දැක්වීමයි
(iv) අවස්ථාවෝචිතව ක්‍රියා කිරීම හා තර්කානුකුලව තීරණ ගැනීමයි

(29) පාවුල්තුමාගේ රෝමයට යෑමේ ගමන තුලින් අප අත් දකින්නේ,
(i) ප්‍රාතිහාර්යය සිදු කිරීමේ බලයයි
(ii) බිහිසුනු අනතුරුවලින් ගැළවීමේ බලයයි
(iii) ලෞකික විනිශ්චයන් වෙනස් කිරීමේ බලයයි
(iv) නිර්භීතව සත්‍යයට සාක්ෂි දැරීමේ බලයයි

(30) පව්කරුවන් සහමුලින්ම ප්‍රතික්ෂේප කල ජුදෙව් ආකල්පය ජේසුස්වහන්සේ අභියෝගයට ලක්කල අවස්ථාවකි,
(i) කුදු ස්ත්‍රිය සුවපත් කිරීම
(ii) සීමොන්ගේ නිවසේදී හමුවූ ස්ත්‍රියගේ ක්‍රියාව අගය කිරීම
(iii) නිකදෙමුස් සමග සංවාදය
(iv) අන්ධ බාර්තිමෙයස් සුව කිරීම

(31) ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක'' යන්නට සාක්ෂි දරුවෙකි,
(i) ක්ලෙයෝපස් (ii) ජුදස් (iii) සාකෙවුස් (iv) ලෙගියොන්

(32) ජේසුස්වහන්සේ මුහුණ පෑ පළමු පරීක්ෂාව මගින් ගම්‍ය වූ වැදගත් සත්‍යතාවයකි,
(i) දේවරාජ්‍යයේ පුරවැසියන් තම ශාරීරික පෝෂණය තමාම සලසා ගතයුතු බව
(ii) දේවගරුබිය පාමින් ප්‍රාතිහාර්යය අත්දැකිය යුතු බව
(iii) මිනිස් දිවිමග තුල ශාරීරික, ආත්මික පෝෂණයද වැදගත් වන බව
(iv) ජීවිත ගැටළු සඳහා විවිධාකාර විසඳුම් සෙවීමට සිදුවන බව

(33) දිවැසිවර ඉගැන්වීම් අනුව සාම කුමාරයාණන් මගින් සිදු කෙරෙන අද්විතීයම කාර්යය වනුයේ,
(i) මිනිස් හදවතේ අභ්‍යන්තර වශයෙන් පරිවර්තනීය සාමයක් ඇති කිරීමයි
(ii) මිහිතලය මත සාම රාජ්‍යයක් ගොඩනැගීමයි
(iii) යුධ වදින දේශයන් අතර සාම ගිවිසුමක් පිහිටුවීමයි
(iv) ශුද්ධ බයිබලීය සාම සංකල්පය ජනතාව අතර ව්‍යාප්ත කිරීමයි

(34) හෙරොද් විසින් මරාදමනු ලැබූ ගලීලයන් හා සිලොවම් බලකොටුවට යටවී මියගිය ජෙරුසලම් වැසියන්ගේ සිදුවීම මගින් ජේසුස් වහන්සේ ඉගැන්වූ ලෙස මිනිසාට ඇතිවන භයානකම විපත නම්,
(i) ස්වාභාවික උපද්‍රවයන්ය (ii) දුෂ්ඨකම් වලට මැදිවීමය
(iii) අධික ලෙස දුක් විඳීමය (iv) මනස්ථාපනය නොවීමේ විපතය

(35) පහත සඳහන් අය අතරින් කමාවීම පිළිබඳ උතුම් ආදර්ශයක් ගෙන දුන්නේ,
(i) ගරු මයිකල් රොද්‍රිගු පියතුමා හා ගරු ඩෙස්මන් ටුටූ පියතුමාය
(ii) ගරු දෙවන ජුවාම් පාවුල් පාප් වහන්සේ හා ගරු පීටර් ජෙරාඩ් පියතුමාය
(iii) ගරු තිස්ස බාලසූරිය පියතුමා හා ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමාය
(iv) තෙරේසා මව්තුමිය හා ඉව්ලින් කානී තුමියය

(36) සාමාන්‍ය ජනතාව දෙවියන්වහන්සේ අතර බාධකය ජේසුස්වහන්සේගේ කුරුසි පූජාව මගින් ඉවත් වූ බවට සංකේතය වූයේ,

(i) දේව මාළිගයේ තිරය දෙකඩ වීමයි

(ii) එදින ඇතිවූ විශාල භූමි කම්පාවයි

(iii) විශාල අන්ධකාරයක් පැතිරීමයි

(iv) ජේසුස්වහන්සේගේ සොහොනේ ගල පෙරළා තිබීමයි

(37) පාවුල් තුමාගේ පළමු ධර්මදූත චාරිකාවෙන් ඉස්මතු වූ වැදගත්ම ලක්ෂණය වූයේ,

(i) හවුල් නායකත්වයයි

(ii) අර්බුද බිඳලීමයි

(iii) සිත් හැරීමයි

(iv) සාක්ෂි දැරීමයි

(38) දෙවියන්වහන්සේගේ රූප විපර්යාසයේදී නිකුත් වූ හඬ මගින් ශ්‍රාවකයන් යොමු කරන ලද්දේ,

(i) ශුද්ධාත්ම අනුහස ජීවිත තුල අත්දැකීමටය

(ii) දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස නිර්භීතව සාක්ෂි දැරීමටය

(iii) ජේසුස්වහන්සේ දේව පුත්‍රයාණන් බව ඇදහිමටය

(iv) යාච්ඤාව තුලින් දේව සබඳතාවය වර්ධනය කර ගැනීමටය

(39) පාවුල් තුමාගේ ඉගැන්වීම අනුව කිතුනු දරුවන් සිය ජීවිත තුළ ඔප් නංවාගත යුතු ගුණාංග වනුයේ,

(i) සංවාදශීලීත්වය, යටත්වීම හා දයාවයි

(ii) පොදුබව, අහිංසක බව හා විවිධත්වයයි

(iii) ඒකත්වය, ජාතිකත්වය හා සමානාත්මතාවයයි

(iv) ගෞරවය, ප්‍රේමය හා කීකරුකමයි

(40) දේව රාජ්‍යයේපුරවැසිභාවය පතන සැම දෙන,

(i) ලෞකිකත්වයෙන් ඇත්වී ඒකාකාරී දිවියක් ගතකල යුතුය

(ii) තම කුරුසිය දරා ගනිමින් පරිපූර්ණ අධ්‍යාත්මිකත්වයක් කරා ගමන් කළ යුතුය

(iii) ආගමික වත් පිළිවෙත් රක්ෂා කරමින් ආගමික සංස්ථා පිරිසිදු කල යුතුය

(iv) සැප සම්පත් රිසිසේ භුක්ති විඳිමින් අන් අයට හැකි ලෙස උපකාර කළ යුතුය

(ලකුණු 1x40=40)